සුප්‍රකට ඩ්‍රැකියුලා නවකතාව ලියූ භීම කථා රචක බ්‍රෑම් ස්ටෝකර් (Bram Stoker) භීම කථා ඇතුළත් කෙටිකථා සංග්‍රහ දෙකක් ද ලියා තිබිණ. ඉන් එකක් වූයේ ඔහුගේ මරණින් පසු බිරිද විසින් පළ කරවනු ලැබූ Dracula’s Guest නම් කෙටිකතා සංග්‍රහය යි. එහි එන කෙටිකතාවක් වන Gypsy Prophecy ඇසුරින් මේ තිරපිටපත සකස් කෙරී ඇත.

මෙහි පුවත වන්නේ අභිකුණ්ඨික ශාස්ත්‍රකාරියක විසින් සැමියා විසින් බිරියට පිහියකින් හානි කෙරෙනු ඇති බවට නව යුවළකට අනාවැකි පළ කිරීමත්, බිරිය එය සිදුවනු ඇතැ යි විශ්වාසයෙන් එය වැළැක්වීමට සියලු පිහි මොට කිරීමත්, සැමියා සතු ව සගවා තිබූ සහ එබැවින් මේ ඉරණමට ලක් නොවූ පිහියකින් අවසානයේ අනාවැකිය සත්‍ය වීමත් ය. ඊඩිපස්, උන්මාද චිත්‍රා ඇතුලු බොහෝ පුවත්වල පරිද්දෙන් මෙහි ද ශාස්ත්‍රය සනාථ වන්නේ එය වැළැක්වීමට ගන්නා උත්සාහය තුළින් ම වීම මෙහි විශේෂත්වය යි.

මුල් කෙටිකතා සංග්‍රහය කතු හිමිකම් ඉවත් ව ඇති පැරණි පොත් නොමිලේ බාගත හැකි Gutenburg.net වෙබ් අඩවියෙන් බාගත් අතර 1970 ට පෙර පළ වූ කෘතියක් බැවින් එහි කතු හිමිකම් නැත. එබැවින් මෙය නිෂ්පාදනය සඳහා ප්‍රකාශන හිමිකම් ඇවැසි නොවේ. මේ තිර පිටපත එහි මූලික කථා පුවතේ සාරය පමණක් ගෙන සෑහෙන වෙනස්කම් එයට සිදුකරමින් සැකසී ඇත.

අධ්‍යක්ෂකවරයාට සුදුසු වෙනස්කම් කරගැනීමට අයිතිය ඇත.

විකාශ කාලය දළ වශයෙන් මිනිත්තු 5/6 ක් පමණ වේ.

තිර රචනය - සචින්ත මදූෂාන් විසිනි.

චරිත

වයස 25-30 ක පමණ මධ්‍යම පාංතික තරුණ යුවලක්.
සංචාරක සාත්තරකරුවෙක්.

## <u>දර්ශනය 1</u>

හුදකලා සෞන්දර්යාත්මක ගම්බද/නගරබද පෙදෙසක්. තරුණ යුවලක්. ඔවුන් චාරිකාවක් පිණිස පැමිණ ඇති බව පෙනේ. දෙදෙනා අතිනත් අල්ලාගෙන සිටී. අවට සිරි බලයි. යම් යම් දේ කතාකරන බවත් සිනාමුසු ව කියා ගන්නා බව පෙනුණත් ඒවා නෑසේ.

ඔවුන් සිටින දර්ශනයේ සිට කැමරාව සෙමෙන් සෙමෙන් දුරස් වෙයි. එවිට ඔවුන්ට ආසන්නයේ ඇති, ප්‍රේක්ෂකයා සිටින පැත්තේ ඇති කිසියම් දෙයක් රූපරාමුවේ පහතින් යාන්තමට කැමරාවට අසු වේ. කැමරාව තවත් පසුපසට වන අතර යුවල මධ්‍යස්ථ දුරක සිට ග්‍රහණය කරගන්නා කැමරාව ඒ දෙය මැත දසුනක් ලෙස එහි සමීපයෙන් ම දැන් ග්‍රහණය කර ගනී. ඒ මිනිසෙකි.

කැමරාව ඔහුගේ සිට වම් පැත්තට වෙමින් උතුරට ගමන් කරන අතර මෙතෙක් කැමරාවට පිටුපස හරවා සිටි ඔහුගේ ඉදිරිපස ග්‍රහණය කර ගනී.

ඔහු අපිරිසිදු ය. ඇඳ සිටින කඩමාලු ඇඳුම ඉපැරණි ලෝගුවක් වැන්නකි. හිසේ රෙදි පටියක් තලප්පාවක් පරිද්දෙන් බැඳ ඇත. රැවුල දිගට වවා ඇත. දෙපා එරමිණියා ගොතා ගෙන තරුණ යුවළ දෙස කල්පනාවෙන් බලා සිටී.

සාත්තරකරු : (තරමක් හඬ නගා) මහත්තයා සාත්තරයක් අහමු ද?

තරුණයා : (නැසුණ සේ සිටී.)

තරුණිය : (තරුණයාගේ මුහුණ බලයි.)

තරුණයා : (ප්‍රශ්නාර්තවත් ව ඇගේ මුහුණ බලයි.)

තරුණිය : (ඔහුට යමක් කියයි. නමුත් එය ප්‍රේක්ෂකයාට නෑසේ.)

තරුණයා : (පිළිතුරු දෙයි. එය ද ප්‍රේක්ෂකයාට නෑසේ.)

තරුණිය : අනේ… ___ නිකං අහලා බලමු.

තරුණයා : ඕනම ද?

තරුණිය : (මුහුණ සතුටින් පුරවාගනිමින් හිස ඉහළ පහළ වනයි. අතිශයෝක්තියෙන් මෙනි.)

තරුණයා : (එය දැක එක්වර ම සිනහ පහළ වේ.)

දෙදෙනා ම : (හඬ නගමින් සිනහ සේ.)

තරුණිය : (හිනැහෙමින්) ඔන්න එහෙනං මං යනවා. (යන්න හදයි. යමක් මතක් වූවා සේ) අනේ ඔයත් එන්නකෝ.

තරුණයා : (අදි මදි කරමින් නමුත් සිනාමුසු ව) නෑ ඔයා ගිහින් අහගන්න. ඔයා නේ ඉතින් ඕවා විශ්වාස කරන්නේ.

තරුණිය : (සිනාමුසු ව ජයග්‍රාහී ලෙස) ඒ වුණාට මේක දෙන්නට ම බලපාන දෙයක් නේ. (හොඳින් පැහැදිලි වන්නට මෙන් අවධාරණය කරමින් සහ අනුරූප ව හිස නළවමින්) ඒ හින්දා දෙන්නම ඕන.

තරුණයා : (සිනාමුසු ව හිස වනමින්) හ්ම්. හ්ම්.

තරුණිය : (සාස්තරකරු වෙත ගොස් කාරුණික ව සිනාසෙමින්) අපිට සාත්තරයක් කියන්න පුලුවන් ද? (අත දිගු කරයි.)

තරුණිය : (අත දිගු කරගෙන සිටිමින් ම සැණෙන් හැරී තරුණයා දෙස බලා සිනාසෙමින් ඔහුට ද එන මෙන් උද්යෝගයෙන් අතින් සන් කරයි.)

තරුණයා : (හෙමින් හෙමින් එයි.)

සාත්තරකරු : මහත්තයාගේ අත දෙන්න.

තරුණයා : (කිසිවක් නොකියා සැහැල්ලුවෙන් සිටී.)

තරුණිය : දෙන්නකෝ අනේ හ්!(ඇය ඔහුගේ අත බලෙන් තමා ම ගෙන සාත්තරකරුට යොමු කරමින්) ආ. (ඔහු විරෝධයක් නො පායි.)

සාත්තරකරු : (එදෙස මොහොතක් බලා නළල රැළි ගන්වා ගනී. සැණෙන් හිස ඔසවා තරුණයාගේ මුහුණ බලයි. ඔහු අපහසුවට පත්වෙන අයුරින් ඔහු ව විනිවිදිනසුලු බැල්මකින් සුලු මොහොතක් බලා හිඳී. වහා හැරී තරුණිය අමතමින්) මෙයාගෙන් පරිස්සම් වෙන්න.

තරුණයා : (උපහාසාත්මක ව කට කොනින්/යන්තමින් සිනා වෙයි. බැරෑරුම් ව ගත් සේ පෙන්වන පරිද්දෙන් නළල රැළි ගන්වාගෙන, තොල් තද කරගෙන හිස ඉහළ පහළ වන යි. එය වුවමනාවට වඩා අතිශයෝක්තියෙන් කරන බව පෙනේ.)

තරුණිය : (මදක් නොසන්සුන් වෙයි. විමතියෙන් හා කුතුහලයෙන් බලා සිටී. කලබලයෙන්/තදින් විමසයි) ඒ මොකද?

සාත්තරකරු : (පහත බලාගෙන නිහඬ ව සිටී.)

තරුණිය : තව ටිකක් විස්තර කියන්න පුලුවන් ද? (අත් බෑගයෙන් යම් මුදලක් ගන්නට තැත් කරයි.)

සාත්තරකරු : (හිස වනා එය ප්‍රතික්ෂේප කරමින්, තරුණයා අමතමින්) ළඟදි දවසක ඔයා මෙයා ව මරන්න හදාවි. (යුවල ම තිගැස්සේ. පසුබිමේ ත්‍රාස සංගීතයක් ඇසෙන්නට ගනී.) ඒත් මැරෙන එකක් නැහැ. (එසැණින් ත්‍රාස සංගීතය නතර වේ.) පිහියට තුවාල වෙලා නවතියි. (අවවාදාත්මක ලෙස) අලුත් මුද්දක් හෙම ගන්න වෙයි.

තරුණයා : (මිට මොළවා ගෙන දත්කුරු කමින්, ඔහුට පහර දෙන්නට මෙන් සදමින්) තමුසේ... තමුසේ... (තරුණිය ඔහු වළක්වයි. හදිසියේ සිහි පැමිණියාක් මෙන් ඔහු කලබලය නවතයි.) තමුසෙට පිස්සු. (නවතා වේගයෙන් තරහින් හුස්ම ගනියි.)

තරුණිය : (යටහත් ස්වරයෙන්) අපි යමු ද දැං ?

තරුණයා : (තරහින් හා උපහාසයෙන්) ඔව්. ඔව්. දැං යමු. වැදගත් දෙයක් දැන ගත්තනේ නේද?

(දෙදෙනා ගමන් කරයි. )

තරුණිය : (ඒ ඇසුණු සැණින් ලැජ්ජාවට පත් ව නිහඬ වේ. මොහොතක් එසේ හිඳ යමක් කල්පනා කරන්නට ගනියි. සිත කොහේදෝ ඈතක ඇති බවක් පෙනේ. නැවත බිම බලමින් ගමන් කරයි. සුලු මොහොතකින් යළි හිස ඔසවයි. හිතේ යම් ප්‍රහේලිකාවක් ඇති බව පෙනේ.

යළි පෙර පරිදි අවට නරඹමින් සැහැල්ලුවෙන් ගමන් කරයි. හදිසියේ සිතට වධ දෙන යමක් මතකයට නැගුණ පරිද්දෙන් යළිත් හිස ඔසවා කල්පනා කරයි. මුහුණේ ශෝකයක්/කලකිරුණු බවක්/මද නුරුස්නාවක් ඇත. නළල දුකින් රැළි ගැන්වෙයි. දෙතොල් ඇතුළට රැළි වන සේ තදකර ගනියි. ඇස් හැඩුම්බර ය. යළි පෙර සේ මෙන් ගමන් කරයි. හිස එසවී තරුණයා දෙස බැලෙයි. ඔහු දකින්නට පෙර සැණින් ඉවත බලා ගනියි. යළි හොරැහින් - මද සැකයකින් යුතු ව ඔහු දෙස බලයි. යළිත් යමක් කල්පනා කරයි. නමුත් පෙර මෙන් සිතට වධ දෙන ගැටලුවක් ඇති බව නො පෙණේ. දෙතොල් යන්තමින් විවර ව - අදහසක් පැමිණි සේ යම් උද්යෝගයක් සටහන් ව ඇත.)

තරුණයා : (ඉවෙන් මෙන් යමක් වැටහී ඇය දෙස හැරී බලයි.)

තරුණිය : (බිය වී තිගැස්සෙයි. නමුත් අනතුරක් නොමැති බව දැන වහා ඔහු හා යන්තමින් සිනා වෙයි. නමුත් ප්‍රාණවත් සිනාවක් නොවේ. සිත සගවාගනිමින් කරන සිනාවකි.)

තරුණයා : (ඇ වෙත හැරෙමින්, තරමක් මුදු ව) අරූ කිව්ව එක අහලනේ ඔච්චර බය වෙලා ඉන්නේ? නේ? (මද විරාමයකින් අනතුරුව සිනාමුසු ව, සනසවන්නට මෙන් ඇගේ උරහිස වටා අතක් දමමින්, මුදු ලෙස) ඔයා ඇත්තට ම ඒක විශ්වාස කරනව ද? මේ මම එහෙම කරයි කියල හිතනව ද? (ඇගේ මුහුණ දෙස අවිහිංසකව බලා සිටී.)

තරුණිය : (හිස දෙපසට වනමින් සෞම්‍ය ලෙස) නෑ. _ ඒත් (කියන්නට ගිය දෙය නවතා ගනී.)

තරුණයා : ඕ-ඒත්?

තරුණිය : (පිළිතුරු දීම මගහරිමින්, විගසින්) අන්න බස් එකක් එනවා. (අත දමයි.) (බසයක් මද දුරින් එනු පෙනේ. ඔවුන් දෙදෙනා අසල බසය නවත යි. දෙදෙනා ම බසයට ගොඩ වන සහ බසයේ සෙනග මැදට යන අයුරු කැමරාව සමීපයෙන් ග්‍රහණය කර ගනී. බසය ගමන් අරඹයි. වේගයෙන් යන බසය කැමරාව එක්වර ම දුර සිට ග්‍රහණය කර ගනී. සුලු මොහොතක් එය පෙන්වයි. දර්ශනය මැකී යයි.)

## <u>දර්ශනය 2</u>

(සාමාන්‍ය පාංතික නිවසක් තුළ. අලුත් පන්නයේ හෝ සුඛෝපභෝගී නිවසක් නොවේ.)

තරුණිය : (සාලය තුළ අතුගාමින්/යමක් අස්පස් කරමින් සිටී.)

තරුණයා : (නිවස තුළ සිට පැමිණේ. නිවසේ ඇතුළේ සිට සාලයට පිවිසෙන තැන සිට ඇත පාර දෙස බලා සිටී.)

තරුණිය : (අතුගාන අතරතුර යමක් කල්පනා කරයි. එය සිත චංචල කරවන යමක් බව මුහුණින් පෙනේ. නොදැනීම අතුගැම නතර වේ. කොස්ස අත තබාගෙන බලා සිටී. මුහුණ හඩන්නට ළං වී තිබේ.)

තරුණයා : (ඇය නතර වී සිටින බව එක්වර ම ඇස ගැටේ. විමසිල්ලෙන්/කුතුහලයෙන් ඇය දෙස බලා සිටී.)

තරුණිය : (උරහිස් සැලෙයි. ඇය හඩන්නට ගෙන ඇති බවක් පෙනේ.)

තරුණයා : (සානුකම්පිත ලෙස ඇය දෙස බලමින් සෙමින් ඉදිරියට පැමිණේ. උරහිසට අත තබා ඇය ව සනසන්නට මෙන් ළං වේ.)

තරුණිය : (ඔහු සිටින බව නොදනී. එලෙස ම සිටී.)

තරුණයා : (ඇය සැනසවීමට උරහිසට අත තැබීමට අත ඔසවයි.)

තරුණිය : (ඔහු එසේ ඔසවත් ම ඒ ගැන ඉවෙන් දැනෙන ඇය වහා තිගැස්සී කෑ ගසමින් සහ අහකට පනිමින්)මෙ...න්/මා..(ව) මර....න් (ඕ) ...

තරුණයා : (සිතාගත නොහැකි ව ඔහු ද තිගැස්සී සිටි ලෙස ම නතර ව බලා සිටී.)

තරුණිය : (භීතියෙන් ඔහු දෙස බලයි. ඔහු ද තිගැස්සී සිටින අයුරු දැක බිය තුනී වී ගිය එහෙත් දැඩි ලෙස සැකමුසු බැල්මකින් ඔහු දෙස බලයි. එසේ දැඩි සැකයෙන් ඔහු දෙස බලා සිටී. සංසුන් වේ. කල්පනා කරයි. ලැජ්ජාවට පත් ව බිම බලා ගනී.)

තරුණයා : (ඇය අසලට සෙමින් සෙමින් පැමිණේ. ඇයගේ උරහිස වටා අතක් දමමින් මදක් ළංකර ගනිමින්) තාම ඒ ගැන ද හිතන්නේ? ම්?

(දර්ශනය වැසී යයි. ඊළඟ දර්ශනය ඇරඹේ.)

## <u>දර්ශනය 3</u>

(නිවසේ කුස්සිය. තරුණිය බියෙන් සැකෙන් මෙන් වටපිට බලමින් කිසිවක් සිදුකරමින් සිටී. හදිසියේ ම තරුණයා ඇය සිටින පෙදෙසට පැමිණේ. එක්වර ම තිගැස්සෙන ඇය සුපුරුදු ලෙස වැඩක් කරමින් සිටි බව හගවමින් දෛනික වැඩවල නිරත වේ. තරුණයාට ඇගේ විශේෂයක් හසු නොවේ/ඔහුගේ අවධානය වෙන යමක් ගැන ය.)

තරුණයා : (පිහි එකින් එක ගෙන මුවාත බලයි. සෑම පිහියක් ම මොට්ට ය.)

තරුණිය : (හොරැහින් ඔහු දෙස බලයි. එසැණ යළි අහක බලා සුපුරුදු බව හගවමින් සිය වැඩෙහි නියුතු වේ. තරුණයා එය ද නොදකී.)

තරුණයා : (සිය වැඩෙහි යෙදෙන අතර මදකට ඈ වෙත හැරී යළි සිය වැඩෙහි නියුතු වෙමින් - පුදුමය සහ ප්‍රශ්නය මුසු හඩකින්) පිහි එකක්වත් කැපෙන්නේ නැහැ නේ?

තරුණිය : (නිහඬව/නෑසුණු සේ සිටී.)

තරුණයා : (තරමක් තරහින් මෙන්) මේ පිහි කැපෙන්නේ නැත්තේ මොකද? හොද කැපෙන පිහි දෙකක් ම තිබ්බා. ඒ දෙක හොයාගන්නවත් නැහැනේ. කෝ ඒවා?

තරුණිය : (තරහෙන්) මං දන්නව යැ. මොට්ට වෙන්න ඇති.

තරුණයා : (හිස වනමින්, තරහෙන්, තදකර ගත් දත් ඇදි අතරින් වචන පිටකරමින්) ඔක්කොම ටික ඉබේ මොටට් වෙලා - නේ. (යමක් සිහි වූ සේ එසැණින් පිට ව යයි.)

තරුණිය : (ඔහු යන දෙස කුතුහලයෙන් බලා සිටී.)

(මොහොතක් ගත වේ. තරුණයා ඈතින් වේගයෙන් පැමිණේ. ඔහු අත අලුත් ම අලුත් දිලිසෙන පිහියකි. ඔහු එය ගෙන පැමිණෙන්නේ ඇය ඉදිරියට ය. එය දකින ඇය දැඩි ව භීතියට පත් වේ. ඔවුන් දෙදෙනා මාරුවෙන් මාරුවට පෙන්විය යුතු ය. දර්ශනය තරමක් වැඩි වේලාවක් පවතී.

ඇයට කෑගැසේ. කෑගසන අතරේ ම ඇය පොල්ලක් ගෙන ඔහුට පහර දීමට තැත් කරයි. ඔහුට ඇගේ ප්‍රතිචාරය අදහා ගත නොහැකි වේ. නමුත් ඔහු ද ප්‍රතිප්‍රහාර එල්ල කරමින් බේරීමට තැත් කරයි. එහි දී ඔහු වදින පිහි පහරකින් ඇගේ ඇඟිලි මදක් කැපී යයි. ඇගේ මගුල් මුදුව ද ඉන් කැපී යන අයුරු කැමරාව ග්‍රහණය කරගනී.)

**නිමි.**